SC

# දළදා පෙරහැර හා බැඳුනු ඓතිහාසික සංස්කෘතිකාංගයන්ගේ වර්තමාන භාවිතය


| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 658 |
| වර්ග අංකය | |

658

# නිබන්ධන සාරාංශය

ක්‍රි.ව. හතරවන සියවසේ කිත්සිරි මෙවන් රජු (ක්‍රි.ව. 301-331) දවස දන්ත ධාතූන් වහන්සේ ලක්දිවට වැඩමවූ දින සිටම සිංහල ජනතාවගේ ජීවන රටාව, දළදාව හා සබැඳුණු සංස්කෘතිකාංගයන් රැසක් එක් වුයේය. ඒ අනුව ඔවුන්ගේ ජීවන රටාව දන්ත ධාතූන් වහන්සේ වටා ගෙතුනහ.

රාජ්‍ය පාලකයා වීමට අවශ්‍ය ප්‍රධානතම සුදුසුකමක් සහ රාජ්‍යත්වය තහවුරු කරන සංකේතයක් බවට දන්ත දාතූන් වහන්සේ පත්වීමත් සමඟ දේශපාලන වශයෙන්ද දළදා වහන්සේගේ වැදගත් කම ඉහළ ගියේය. රාජ්‍ය පාළකයාගේ ආරක්‍ෂාව හා ගෞරවය මත දන්ත ධාතූන් වහන්සේ වැඩ සිට අතර, ආරක්‍ෂාව තහවුරු කර ගනිමින් තම වැසියා හට ධාතූන් වහන්සේ නැරඹීමටත් පුජෝපහාර දැක්වීමටත් අවස්ථාව සලසා දුනි. මෙරට වැසියන්ගේ රාජ්‍ය පාලනය පමණක් නොව කර්මාන්ත, කලාශිල්ප, චාරිත්‍ර වාරිත්‍ර, පුද සිරිත්, ගෘහ ජිවිතය සම්බන්ධ යම් යම් අංශයන්ද ශ්‍රී දළදා වහන්සේ වටා නිර්මාණය වන්නට විය.

එමෙන්ම දළදා වහන්සේට ගෞරව පිණිස කිත්සිරි මෙවන් රජ්‍ය (ක්‍රි.ව. 301-331) සමයේ ආරම්භ වූ දළදා පෙරහැර වර්තමානය දක්වාම බෞද්ධයෝ වාර්ෂිකව පවත්වනු ලබති.

පෙරහැරක ස්වරූපය, එය පවත්වනු ලබන අවස්ථාව සහ පෙරහැරෙහි විකාශනය පිළිබඳව මතවාදයන් ගණනාවකි. *International Encyclopedia of the Social Science* හි පෙරහැර අර්ථ නිරූපණය කර තිබෙනුයේ "*සංවිධානාත්මක වූ ජන සමූහයක විධිමත් හෝ උත්සවාත්මක ලෙස ඉදිරියට යාමක්*"[1] ලෙසය. එමෙන්ම ජනශ්‍රුති ශබ්ද කෝෂයේ විග්‍රහ කරන පරිදි පෙරහරක් යනු,

*"පෙරහැර (ජන) ගෞරවය පිණිස තූර්ය වාදන හා කොඩි කුඩ දද සහිතව යන ගමන විහාරස්ථාන වල බුදුන් වහන්සේට ගෞරව පිණිස කොඩි දද පතාක සහිතව පැමිණීම දැකිය හැකිය. මෙය සිංහල බෞද්ධ ආගමික සිරිතකි. විචිත්‍ර කලා නිර්මාණයක් ලෙස අද පෙරහැර පත්ව තිබේ."* [2]

ශ්‍රී ලාංකික සංස්කෘතිය පෙන්වන එක් මාධ්‍යයක් ලෙසද දළදා පෙරහැර හැඳින්විය හැකිය. පෙරහැර හා බැඳුණු සංස්කෘතිකාංගයන් ඒ ඒ කාලයන්ට අනුරූපව විවිධ ස්වරූප ගනු ලැබීය. ඊ.බී. ටයිලර් සංස්කෘතිය අර්ථ නිරූපණය කරනුයේ *" සමාජයේ ජීවත්වන පුද්ගලයා විසින් ලබාගන්නා වූ දැනුම, අඳහිලි, කලා ශිල්ප, නීති, සදාචාර සිරිත් විරිත් යන සියලුම අංගයන්ගේ එකතුවක්"*[3] ලෙසය.

26 AUG 2011

දයා අමරසේකරගේ අදහසට අනුව සංස්කෘතිය යනු,

*"සංස්කෘතිය හෝ සභ්‍යත්වය යනු දැනුම, ඇදහිලි, කලාශිල්ප, නීති, සදාචාර, සිරිත් විරිත් හා මිනිසා සමාජයේ ජීවත්වන පුද්ගලයෙකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු ඇබ්බැහිකම් හා හැකියාවන් අඩංගු සංකීර්ණ සමස්ථ සමුදායයි."*[4]

මේ අයුරින් විමර්ශනය කරන විට සංස්කෘතිය යනු කාලීනව වෙනස් වන්නක් විය. කිත්සිරිමෙවන් රාජ්‍ය (ක්‍රි.ව. 301-331) සමයෙහි, දළදා වහන්සේ මෙරටට වැඩම කළ දා පටන්ම ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් වීම දක්වා දළදා පෙරහැර යම් යම් සංස්කෘතික වෙනස්කම් සහිතව විකාශනය විය. දහනවවන සියවස මුල් භාගයේ ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත්වීමෙන් පසුව මෙරට සමාජ, ආර්ථික, දේශපාලන ක්‍රියාකාරිත්වයේ ඇතිවූ වෙනස්කම්ද දළදා පෙරහැර හා බැඳුණු සංස්කෘතිකාංගයන්ගේ සම්ප්‍රදායික ස්වරූපයන් යම් යම් වෙනස්කම් වලට ලකවීම සඳහා බලපානු ලැබීය.

අතීතයේ සිටම පැරැන්නන් අතර ඇසළ මාසය පෙරහැර මාසය ලෙස ජනප්‍රිය විය. එයට හේතු වූයේ දන්ත ධාතූන් වහන්සේ මෙරටට වැඩම වීමත් සමඟ ඒ හා සබැඳිව, ඇසළ

මාසයේ සුවිශේෂී බෞද්ධ උත්වයක් ලෙස පෙරහැර පැවැත්වීම ආරම්භ වීමය. ඒ නිසාම ශ්‍රී ලාංකිකයෝ දළදා පෙරහැර ඇසළ මංගල්‍ය නමින් හඳුන්වනු ලබති දළදා පෙරහැරෙහි ආරම්භය දළදා වහන්සේ මෙරටට වැඩම කළ කිත්සිරිමෙවන් රාජ්‍ය (ක්‍රි.ව. 301-331) සමය දක්වා දිව යයි. මෙසේ ආරම්භ වු පෙරහැර යුගයෙන් යුගය විවිධ වෙනස් කම් වලට බඳුන් වෙමින් ඒ හා බැඳුණු විවිධ සංස්කෘතිකාංගයෝ සමඟ වර්තමානය දක්වාම පවත්වනු ලබති.

කෙසේ වුවද දළදා පෙරහැර හා සබැඳුණු සංස්කෘතිකාංගයන් පිළිබඳව සාකච්ඡා කිරීමේදී උඩරට රාජධානි සමය සුවිශේෂිතය. මන්ද එකළ ශ්‍රී ලාංකික සංස්කෘතියේ සුවිශේෂී වෙනස්කම් සිදුවුවා සේම දළදා පෙරහැරටද එම වෙනස්කම් බලපෑ නිසාවෙනි. 1815 බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට ලංකාව පත්වීමත් සමඟ එතෙක් පෙරහැර හා බැඳුණු විවිධ අංශයන්ගේ පැහැදිලි වෙනස්කම් කිහිපයක් සිදු විය.

මන්ද පෙරහැර පැවැත්වීමේ පූර්ණ වගකිම් දාරියා වු රජු යන තනතුර අහෝසි වීම, රාජකාරී ක්‍රමය ක්‍රියාත්මක නොවීමත් සමග සම්ප්‍රදායිකව පෙරහැර හා සම්බන්ධ වත් පිළිවෙත් සම්ප්‍රදායන් ඉටු කළ ජනයා හට ඒ ඒ රාජකාරීන්ගෙන් ඉවත් වීමට ඉඩ ප්‍රස්ථාව ලැබීමත් යන හේතූන් දළදා පෙරහැරෙහි සියලුම අංශයන් කෙරෙහි සෘජුවම බලපානු ලැබීය. මෙම හේතූන් නිසා පෙරහැර සම්බන්ධ විවිධ නිලධාරීන්ගේ මෙන්ම ශිල්පීන්ද ඉටු කරනු ලබන කාර්යයන්ගේ ද වෙනස්කම් දැකිය හැකිය.

දළදා පෙරහැර හා බැඳුණු සංස්කෘතික ලක්ෂණ වෙනස්කම් වලට බඳුන්වීමේ සුවිශේෂිම කඩඉම නම් විසිවන සියවසේ අගභාගයේ මෙරට සිදුවු සමාජ, ආර්ථික, දේශපාලන වෙනස් කම්ය. මෙම වෙනස්කම් දළදා පෙරහැරද වාණිජවාදි ස්රූපයක් කරා ගෙන යාමට තරම් ප්‍රබල වු අතර එමෙන්ම එම සාධක පෙරහැරෙහි ගමන් කරන ශිල්පීන් පමණක් නොව එහි ගමන් ගන්නා අලි ඇතුන්ගේ ස්වරූපය පවා වෙනස් වු වාණිජවාදි සංස්කෘතියක් තුළ ගොඩ නංවනු ලැබීය. මෙම හේතූන්ගේ ප්‍රතිඵල ප්‍රබල ලෙස දැකිය හැකි වනුයේ ශ්‍රී ලාංකික ජන සමාජයේය. ජන සමාජයද වර්තමානයේ ඇතිව තිබෙන වාණිජවාදි ස්වරූපය සහ

නොයෙකුත් පාරිසරික හේතූන් මත බහු සංස්කෘතික ජිවිත ගත කරන සමාජයක් බවට පත්ව ඇත. මෙවැනි ජන සමාජයන් හා දළදා පෙරහැර හා බැඳුණු සංස්කෘතිකාංගයන් එකිනෙක සබඳතා පැවැත්වීමේදි කැපී පෙනෙන වෙනස්කම් රැසක් දැකගත හැකිය.

දළදා පෙරහැර හා බැඳුණු සංස්කෘතිකාංගයෝ ශ්‍රී ලාංකික සමාජයේ එදිනෙදා සිදුවූ සමාජ, ආර්ථික, දේශපාලන හේතූන් සමඟ ගණු දෙණු කිරීමේ දි සුවිශේෂී වෙනස්කම් වලට හා විපරිවර්තනයන්ට වර්තමානය වන විට ලක්ව තිබෙන බව දැකිය හැකිය.